**PART I**
2ND

**2nd Reading (Part I)**
**T-09**
**1-13**

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,313 - 2022 දෙසැම්බර් මස 30 වැනි සිකුරාදා - 2022.12.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — | පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1348 | දේපළ විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 1394 |

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 0 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 ජනවාරි 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 ජනවාරි මස 05 වැනි දින දහවල් 12 0ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1217- B 82415— 5,403 (2022/12)

# තනතුරු - ඇබෑර්තු

## මහනුවර මහා නගර සභාවේ තොරතුරු තාක්ෂණ නිපුණතා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම - 2023

1987 අංක 19 දරන මහා නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරිය) 40(1) වගන්තිය යටතේ තොරතුරු තාක්ෂණ නිපුණතා නිලධාරී තනතුර සඳහා මහනුවර මහා නගර සභා බල ප්‍රදේශයේ පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය (කොන්ත්‍රාත් පදනම මත) :

1.1 බඳවා ගැනීමේ පොදු කොන්දේසි :

1.1.1 අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

1.1.2 අයදුම්කරුවන් මධ්‍යම පළාත තුළ පදිංචි අයදුම්කරුවන් විය යුතුය. (අයදුම්කරුවන්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුනක (03ක) කාලයක් මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු බවට සනාථ කෙරෙන ලියවිලි සම්මුඛ පරීක්ෂණයේදී අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුය.)

1.1.3 අයදුම්කරුවන්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු හා වයස අවු. 35 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයන් හට මෙම තනතුරු සඳහා ඉල්ලුම් කළ නොහැක.

1.1.4 අයදුම්කරුවන්, විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් සිටිය යුතුය.

1.1.5 සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

- **සටහන**

  අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

1.2 *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1.2.1 මෙම තනතුර මහනුවර මහා නගර සභාවේ ගරු මහා සභා අනුමැතිය මත සේවා අවශ්‍යතාවය සලකා පිහිටුවා ගනු ලබන තනතුරක් වන අතර මහා නගර සභා ආඥාපනතේ (40) 1, (ආ), (ආ), (ඇ) (ඈ) යන විධිවිධානයන්ට යටත් වේ. මෙම තනතුර විශ්‍රාම වැටුප් රහිතය. ගරු මහා සභාව විසින් හෝ නාගරික කොමසාරිස්වරයා විසින් සේවා අවශ්‍යතාවය මත නිර්ණය කරනු ලබන කාල සීමාවන් සඳහා සේවයේ නියුක්ත කරවනු ලබයි. එසේ ම මෙම තනතුරු සම්බන්ධව ගරු මහා සභාව හෝ නාගරික කොමසාරිස්වරයා ඉදිරියේදී ගනු ලැබිය හැකි තීරණයන් ට මෙහි සඳහන් කරුණු යටත් වේ.

1.2.2 *මාසික දීමනාව* .- තොරතුරු තාක්ෂණ නිපුණතා නිලධාරී තනතුර සඳහා හිමි මාසික දීමනාව රු. 50,000.00 කි.

2. තනතුර හා අධ්‍යාපන සුදුසුකම් :

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *බඳවා ගැනීමට අවශ්‍ය උපරිම තනතුරු ගණන* | *වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද* | *අධ්‍යාපන සුදුසුකම්* | *රාජකාරී ස්වභාවය* |
|---|---|---|---|---|---|
| 01 | තොරතුරු තාක්ෂණ නිපුණතා නිලධාරී | 01 | 1. අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) වෘත්තීය පළපුරුද්ද ලබා තිබීම | අධ්‍යයන පොදු සහතික පත්‍ර සා. පෙළ විභාග යේ දී සිංහල, ගණිතය හා ඉංග්‍රීසි භාෂාව ඇතුලු සම්මාන 05ක් සහිතව විෂයන් 06කින් එකවර සමත්වීම හා අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් විෂයන් 03 ක් (සාමාන්‍ය ඉංග්‍රීසි හැර සමත්වීම) *හා* | |

| අනු. අංකය | තනතුරු නාමය | බඳවා ගැනීමට අවශ්‍ය උපරිම තනතුරු ගණන | වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද | අධ්‍යාපන සුදුසුකම් | රාජකාරී ස්වභාවය |
|---|---|---|---|---|---|
| | | | | 1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.<br>*හෝ*<br>2.I විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් සහිත උපාධියක් ලබා තිබීම (මෙහිදී සම්පූර්ණ උපාධියෙන් අවම වශයෙන් 1/3 කොටසක් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය විය යුතුය.)<br>*සහ*<br>II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.<br>*හෝ*<br>3.I විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් උපාධියක් ලබා තිබීම; *සහ*<br>II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.<br>*හෝ* | |

| අනු. අංකය | තනතුරු නාමය | බඳවා ගැනීමට අවශ්‍ය උපරිම තනතුරු ගණන | වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද | අධ්‍යාපන සුදුසුකම් | රාජකාරි ස්වභාවය |
|---|---|---|---|---|---|
| | | | | 4. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා (NVQ 7) හත මට්ටම හෝ ඊට ඉහළ (NVQ) සහතිකයක් ලබා තිබීම. | |

** ඉහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමේ දී මහනුවර මහා නගර සභාවේ පවතින සේවා අවශ්‍යතාවය සළකා ඒ අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :* 100% විවෘත පදනම මත

- ඉදිරිපත් කර ඇති අයදුම්පත් අතුරින් සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කර ඉහළ ම ලකුණු ලබා ගන්නා අයදුම්කරු බඳවා ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී පහත අංශ කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

| පරීක්ෂාකර ලකුණු ලබාදෙන ශීර්ෂ | | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ දැනුම | 50 | උපරිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩුව අනුව තෝරා ගනු ලැබේ. |
| 02 | අතිරේක අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් | 15 | |
| 03 | වෘත්තීය පළපුරුද්ද (එක් අවුරුද්දක පළපුරුද්ද සඳහා ලකුණු 5 බැගින් උපරිම අවු. 05 ක් සඳහා) | 25 | |
| 04 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 10 | |
| | මුළු ලකුණු | 100 | |

04. අයදුම් කළයුතු ආකාරය :

4.1 මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි (A4) 12 x 8'27 ප්‍රමාණයේ පිටුවල දෙපසම භාවිතා කරමින් අයදුම්පතක් සකස් කර **2023 ජනවාරි මස 15 දිනට** හෝ ඊට පෙර නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4.2 ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරේ අයදුම් කරන තනතුර අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

4.3 නියමිත දිනට නොලැබෙන අයදුම්පත් දැනුම දීමකින් තොරව ප්‍රතික්ෂෙ කරනු ලැබේ.

4.4 අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය.

01. උප්පැන්න සහතිකය;
02. අධ්‍යාපන සහතිකය;
03. පදිංචිය සනාථ කිරීමේ ග්‍රාම නිලධාරී විසින් මාස තුනක කාලයක් තුළ නිකුත් කරන ලද සහතිකය;
04. මෑතකදී ලබාගත් චරිත සහතිකය;
05. වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
06. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත.

(මුල් පිටපත සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු බැවින් මුල් පිටපත් එවීමෙන් වළකින ලෙස කාරුණිකව දන්වමි.)

කේ. කේ. ජී. අයි. ඩී. පී. විජේතිලක,
මහනුවර නාගරික කොමසාරිස්,

2022 දෙසැම්බර් මස 22 වැනි දින,
මහනුවර මහා නගර සභාවේ දී ය.

## ආදර්ශ අයදුම්පත්‍රය

### මහනුවර මහා නගර සභාවේ තොරතුරු තාක්ෂණ නිපුණතා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම

01. අයදුම්කරු අයත් වන පළාත් පාලන ආයතනය :..........................................................................

02. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) :..........................................................................

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්) :..........................................................................

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):..........................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

04. උපන්දිනය වර්ෂය:............... මාසය:............... දිනය:...............

05. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (2023.01.15) වයස : අවුරුදු:......... මාස:......... දින:.........

06 ස්ත්‍රී පුරුෂ භාවය :.........................................

07. විවාහක/අවිවාහක භාවය :.........................................

08. ස්ථිර ලිපිනය :.........................................

09. දුරකථන අංකය :.........................................

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? :.........................................

එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචියෙන්ද? යන බව :.........................................

11. අධ්‍යාපන සුදුසුකම්

11.01 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය
වර්ෂය :...............
විභාග අංකය :...............

| අනු අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

11.02 අ.පො.ස. (උසස් පෙළ) විභාගය
වර්ෂය :...............
විභාග අංකය :...............

| අනු අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

11.03 ප්‍රාථමික උපාධි තොරතුරු :..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................

11.04 පශ්චාත් උපාධි/ඩිප්ලෝමා .................................................................................................................
.................................................................................................................
.................................................................................................................
.................................................................................................................
.................................................................................................................

11.05 පශ්චාත් උපාධි/ඩිප්ලෝමා (තොරතුරු තාක්ෂණය සම්බන්ධ)
.................................................................................................................
.................................................................................................................
.................................................................................................................
.................................................................................................................

12. වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද :
.................................................................................................................
.................................................................................................................
.................................................................................................................
.................................................................................................................

13. අයදුම්කරුගේ සහතිකය

මා විසින් ඉහතින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. ඉහත තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා පත් කිරීම සඳහා නුසුදුස්සකු වන බවත්, තෝරාගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා වහාම සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් පැහැදිලිව දනිමි.

.................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :..................

12-646/1

---

**මහනුවර මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ ගිනි නිවාරණ සේවා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම - 2023**

1987 අංක 19 දරන මහා නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරිය) 40(1) වගන්තිය යටතේ ගිනි නිවාරණ සේවා නිලධාරි තනතුර සඳහා මහනුවර මහා නගර සභා බල ප්‍රදේශයේ පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය (කොන්ත්‍රාත් පදනම මත) :

1.1 බඳවා ගැනීමේ පොදු කොන්දේසි :

1.1.1 අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

1.1.2 අයදුම්කරුවන් මහනුවර මහා නගර සභා බල ප්‍රදේශයේ පදිංචි පිරිමි අයදුම්කරුවන් විය යුතුය. (අයදුම්කරුවන්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුනක (03ක) කාලයක් මෙම මහනගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු බවට සනාථ කෙරෙන ලියවිලි සම්මුඛ පරීක්ෂණයේ දී අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුය.)

1.1.3 අයදුම්කරුවන්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු හා වයස අවු. 30 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයන් හට මෙම තනතුරු සඳහා ඉල්ලුම් කළ නොහැක.

1.1.4 අයදුම්කරුවන්, විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් සිටිය යුතුය.

1.1.5 සෑම අපේක්ෂකයෙකු ම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

1.1.6 අඩි 5යි අඟල් 4ක අවම උසකින් යුක්ත විය යුතුය.

1.1.7 කි. ග්‍රෑම් 56ක අවම බරකින් යුක්ත විය යුතුය.

1.1.8 පපුව අඟල් 32 ට (ප්‍රසාරණය කළ විට) නොඅඩු විය යුතුය.

1.1.9 කායික මානසික යෝග්‍යතාවය සේවය කිරීම සඳහා සුදුසු බවට රජයේ පිළිගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

- සටහන

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

1.2 *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1.2.1 මෙම තනතුර මහනුවර මහා නගර සභාවේ ගරු මහා සභා අනුමැතිය මත සේවා අවශ්‍යතාවය සලකා පිහිටුවා ගනු ලබන තනතුරක් වන අතර මහා නගර සභා ආඥාපනතේ (40) 1, (ආ), (ආ), (ඇ) (ඇ) යන විධිවිධානයන්ට යටත් වේ. මෙම තනතුර විශ්‍රාම වැටුප් රහිතය. ගරු මහා සභාව විසින් හෝ නාගරික කොමසාරිස්වරයා විසින් සේවා අවශ්‍යතාවය මත නිර්ණය කරනු ලබන කාල සීමාවන් සඳහා සේවයේ නියුක්ත කරවනු ලබයි. එසේම මෙම තනතුරු සම්බන්ධව ගරු මහා සභාව හෝ නාගරික කොමසාරිස්වරයා ඉදිරියේ දී ගනු ලැබිය හැකි තීරණයන්ට මෙහි සඳහන් කරුණු යටත් වේ.

1.2.2 මාසික දීමනාව : ගිනි නිවාරණ සේවා නිලධාරි තනතුර සඳහා හිමි මාසික දීමනාව රු. 29,500.00 කි.

2. තනතුර හා අධ්‍යාපන සුදුසුකම් :

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *බඳවා ගැනීමට අවශ්‍ය උපරිම තනතුරු ගණන* | *වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද* | *අධ්‍යාපන සුදුසුකම්* | *රාජකාරී ස්වභාවය* |
|---|---|---|---|---|---|
| 01 | ගිනි නිවාරණ සේවා නිලධාරී | 12 | ගිනි නිවීම් පුහුණුව පිළිබඳ පාඨමාලාවක් හදරා තිබීම අමතර සුදුසුකමකි.<br><br>බර වාහන පැදවීමේ රියදුරු බලපත්‍රය ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ | අධ්‍යයන පොදු සහතික පත්‍ර සා. පෙළ විභාගයේ දී අඩු වශයෙන් වාර දෙකකදී සිංහල/දෙමළ/ගණිතය විද්‍යාව ඇතුළු විෂයයන් (6)ක් සමත් වී තිබිය යුතු අතර ඉන් විෂයයන් 05 ක් එක් අවස්ථාවකදී සමත් වී තිබිය යුතුය. | ගිනි කැඳවීමකට යාමට හෝ ගිනි නිවීම් සේවාව වෙත පවරා ඇති වෙනත් සේවාවක් ඉටු කිරීම සඳහා ඕනෑම අවස්ථාවක සූදනමින් සිටීම. |

** ඉහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමේ දී මහනුවර මහා නගර සභාවේ පවතින සේවක අවශ්‍යතාවය සලකා ඒ අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

03. බඳවා ගැනීමේ ක්‍රමය : 100% විවෘත පදනම මත

ඉදිරිපත් කර ඇති අයදුම්පත් අතුරින් සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කර ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී පහත අංශ කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

| පරීක්ෂාකර ලකුණු ලබාදෙන ශීර්ෂ | | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | උපරිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු අනුව තෝරා ගනු ලැබේ. |
| 02 | ක්ෂේත්‍රයට අදාලව සම්පූර්ණ කර ඇති වෘත්තීය පුහුණු පාඨමාලා | 20 | |
| 03 | ක්ෂේත්‍රයට අදාළ කරුණු සම්බන්ධව ප්‍රශ්න කිරීම | 30 | |
| 04 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | 30 | |
| | මුළු ලකුණු | 100 | |

04. අයදුම් කළයුතු ආකාරය :

4.1 මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි (A4) 12 x 8'27 ප්‍රමාණයේ පිටුවල දෙපසම භාවිතා කරමින් අයදුම්පතක් සකස් කර **2023 ජනවාරි මස 15 දිනට** හෝ ඊට පෙර නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4.2 ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරේ අයදුම් කරන තනතුර අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

4.3 නියමිත දිනට නොලැබෙන අයදුම්පත් දැනුම දීමකින් තොරව ප්‍රතික්ෂෙ කරනු ලැබේ.

4.4 අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය.

01. උප්පැන්න සහතිකය
02. අධ්‍යාපන සහතිකය
03. පදිංචිය සනාථ කිරීමේ ග්‍රාම නිලධාරී විසින් මාස තුනක කාලයක් තුල නිකුත් කරන ලද සහතිකය
04. මෑතකදී ලබාගත් චරිත සහතිකය
05. වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
06. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත

(මුල් පිටපත සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු බැවින් මුල් පිටපත් එවීමෙන් වළකින ලෙස කාරුණිකව දන්වමි.)

කේ. කේ. ජී. අයි. ඩී. පී. විජේතිලක,
මහනුවර නාගරික කොමසාරිස්,

2022 දෙසැම්බර් මස 22 වැනි දින,
මහනුවර මහා නගර සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**මහනුවර මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ ගිනි නිවාරණ සේවා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම**

01. අයදුම්කරු අයත් වන පළාත් පාලන ආයතනය :.........................................................................

02. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) :.........................................................................

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්) :.........................................................................

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):.........................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

04. උපන්දිනය : වර්ෂය:............... මාසය:............... දිනය:...............

05. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (2023.01.15) වයස : අවුරුදු:......... මාස:......... දින:.........

06 ස්ත්‍රී පුරුෂ භාවය :.........................................

07. විවාහක/අවිවාහක භාවය :.........................................

08. ස්ථිර ලිපිනය :.........................................

09. දුරකථන අංකය :.........................................

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? :.........................................

එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචියෙන්ද? යන බව :.........................................

11. අධ්‍යාපන සුදුසුකම්

11.01 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය
වර්ෂය :...............
විභාග අංකය :...............

| අනු අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

11.02 අ.පො.ස. (උසස් පෙළ) විභාගය
වර්ෂය :...............
විභාග අංකය:...............

| අනු අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

12. වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද :

.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................

13. අයදුම්කරුගේ සහතිකය :

මා විසින් ඉහතින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. ඉහත තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා පත් කිරීම සඳහා නුසුදුස්සකු වන බවත්, තෝරාගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා වහාම සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් පැහැදිලිව දනිමි.

.................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :...........................

12-646/2

## මහනුවර මහා නගර සභාවේ මුල් ළමාවිය සංවර්ධන උපකාරක නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම් - 2023

1987 අංක 19 දරන මහා නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරය) 40(1) වගන්තිය යටතේ මුල් ළමාවිය සංවර්ධන උපකාරක නිලධාරී තනතුර සඳහා මහනුවර මහා නගර සභා බල ප්‍රදේශයේ පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය (කොන්ත්‍රාත් පදනම මත) :

1.1 බඳවා ගැනීමේ පොදු කොන්දේසි :

1.1.1 අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

1.1.2 අයදුම්කරුවන් මහනුවර මහා නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි කාන්තා අයදුම්කරුවන් විය යුතුය. (අයදුම්කරුවන්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුනක (03ක) කාලයක් මෙම මහා නර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු බවට සනාථ කෙරෙන ලියවිලි සම්මුඛ පරීක්ෂණයේ දී අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුය.)

1.1.3 අයදුම්කරුවන්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු හා වයස අවු. 30 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයන් හට මෙම තනතුරු සඳහා ඉල්ලුම් කළ නොහැක.

1.1.4 අයදුම්කරුවන්, විශිෂ්ඨ චරිතයකින් හා මසා සෞඛ්‍ය තත්වයකින් සිටිය යුතුය.

1.1.5 සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

1.1.6 අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

1.2 *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1.2.1 මෙම තනතුර මහනුවර මහා නගර සභාවේ ගරු මහා සභා අනුමැතිය මත සේවා අවශ්‍යතාවය සලකා පිහිටුවා ගනු ලබන තනතුරක් වන අතර මහා නගර සභා ආඥාපනතේ (40) 1, (ආ), (ආ), (ඇ) (ඇ) යන විධිවිධානයන්ට යටත් වේ. මෙම තනතුර විශ්‍රාම වැටුප් රහිතය. ගරු මහා සභාව විසින් හෝ නාගරික කොමසාරිස්වරයා විසින් සේවා අවශ්‍යතාවය මත තීර්ණය කරනු ලබන කාල සීමාවන් සඳහා සේවයේ නියුක්ත කරවනු ලබයි. එසේම මෙම තනතුරු සම්බන්ධව ගරු මහා සභාව හෝ නාගරික කොමසාරිස්වරයා ඉදිරියේ දී ගනු ලැබිය හැකි තීරණයන්ට මෙහි සඳහන් කරුණු යටත් වේ.

1.2.2 මාසික දීමනාව : මුල් ළමාවිය සංවර්ධන උපකාරක නිලධාරී තනතුර සඳහා හිමි මාසික දීමනාව රු. 27,000.00 කි.

2. තනතුර හා අධ්‍යාපන සුදුසුකම් :

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *බඳවා ගැනීමට අපේක්ෂිත උපරිම තනතුරු ගණන* | *වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද* | *අධ්‍යාපන සුදුසුකම්* | *රාජකාරී ස්වභාවය* |
|---|---|---|---|---|---|
| 01 | මුල් ළමාවිය සංවර්ධන උපකාරක නිලධාරි | 10 | 01. පූර්ව පාඨශාලා අධ්‍යාපනය පිළිබඳ විවෘත විශ්ව විද්‍යාලයේ බාහිර සේවා මණ්ඩලය මගින් නිකුත් කරන පූර්ව පාසැල් අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාව හෝ | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සා. පෙළ විභාගයේ දී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය හා තවත් විෂයයන් (2) දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එක්වර විෂයයන් 06කින් අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත් වී තිබීම හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක් වත් සමත් වී තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) | පෙර පාසල් දරුවන් සාමාජානුයෝජනගත කිරීම, දරුවන්ගේ පෞරුෂය වර්ධනය, දැනුම, කුසලතා ආකල්ප වලින් පිරිපුන් දරුවන් බවට පත් කර නිර්මාණශීලී දරුවන් බිහිකිරීම සඳහා මූලික පදනම සැකසීම |

| අනු. අංකය | තනතුරු නාමය | බඳවා ගැනීමට අපේක්ෂිත උපරිම තනතුරු ගණන | වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද | අධ්‍යාපන සුදුසුකම් | රාජකාරි ස්වභාවය |
|---|---|---|---|---|---|
| | | | 02. ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ළමා ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි කර ඇති ආයතන මගින් පිරිනමනු ලබන පෙර පාසැල් ගුරු පුහුණු ඩිප්ලෝමාව හෝ<br><br>03. මධ්‍යම පළාත් සභාවේ මුල් ළමා විය සංවර්ධන ඒකකය මගින් පිරිනමනු ලබන පෙර පාසැල් ගුරු පුහුණු ඩිප්ලෝමාව හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමත අයතන මගින් පිරිනමනු ලබන පෙර පාසැල් ගුරු පුහුණු ඩිප්ලෝමාව ලබා තිබීම.<br><br>*මෙම ඩිප්ලෝමා පාඨමාලාවේ කාල සීමාව අවම වශයෙන් වසරක් හෝ ඊට වැඩි විය යුතුය. තවද ඉංග්‍රීසි මාධ්‍ය ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම විශේෂ සුදුසුකමකි | * එම විභාගයන්හි දී චිත්‍රකර්මය, සංගීතය හා නැටුම් යන සෞන්දර්ය විෂයයන්ගෙන් සමත්වීම විශේෂ සුදුසුකමක් වනු ඇත. | |

** ඉහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමේ දී මහනුවර මහා නගර සභාවේ පවතින සේවා අවශ්‍යතාවය සළකා ඒ අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

03. බඳවා ගැනීමේ ක්‍රමය : 100% විවෘත පදනම මත

- ඉදිරිපත් කර ඇති අයදුම්පත් අතුරින් සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කර ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී පහත අංශ කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

| | පරීක්ෂාකර ලකුණු ලබාදෙන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 | උපරිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු අනුව තෝරා ගනු ලැබේ. |
| 02 | වෘත්තීය පළපුරුද්ද (එක් අවුරුද්දක පළපුරුද්ද සඳහා ලකුණු 5 බැගින් උපරිම අවු. 05 ක් සඳහා) | 25 | |
| 03 | මහනුවර මහා නගර සභාවට අයත් පෙර පාසැලක පුහුණුව ලබා තිබීම | 10 | |
| 04 | නර්තනය, ගායනය, වාදනය චිත්‍ර කලාව හා නිර්මාණශීලීත්වය (අත්කම් නිර්මාණ) ආදී විෂයයන් අතුරින් විෂයයන් 02 ක් සම්බන්ධව සිදු කරනු ලබන ප්‍රායෝගික ඉදිරිපත් කිරීම් (කාලය විනාඩි 05යි) | 35 | |
| | මුළු ලකුණු | 100 | |

04. අයදුම් කළයුතු ආකාරය ඃ

4.1 මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි (A4) 12 x 8'27 ප්‍රමාණයේ පිටුවල දෙපසම භාවිතා කරමින් අයදුම්පතක් සකස් කර **2023 ජනවාරි මස 15 දිනට** හෝ ඊට පෙර නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4.2 ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරේ අයදුම්කරන තනතුර අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

4.3 නියමිත දිනට නොලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4.4 අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය.

01. උප්පැන්න සහතිකය
02. අධ්‍යාපන සහතිකය
03. පදිංචිය සනාථ කිරීමේ ග්‍රාම නිලධාරී විසින් මාස තුනක කාලයක් තුළ නිකුත් කරන ලද සහතිකය
04. මෑතකදී ලබාගත් චරිත සහතිකය
05. වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
06. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත

(මුල් පිටපත සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු බැවින් මුල් පිටපත් එවීමෙන් වළකින ලෙස කාරුණිකව දන්වමි.)

කේ. කේ. ජී. අයි. ඩී. පී. විජේතිලක,
මහනුවර නාගරික කොමසාරිස්,

2022 දෙසැම්බර් මස 22 වැනි දින,
මහනුවර මහා නගර සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**මහනුවර මහා නගර සභාවේ මුල් ළමාවිය සංවර්ධන උපකාරක නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම**

01. අයදුම්කරු අයත් වන පළාත් පාලන ආයතනය :........................................................................

02. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) :........................................................................

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්) :........................................................................

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):........................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

04. උපන්දිනය වර්ෂය:............... මාසය:............... දිනය:...............

05. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (2023.01.15) වයස අවුරුදු:......... මාස:......... දින:.........

06 ස්ත්‍රී පුරුෂ භාවය :.........................................

07. විවාහක/අවිවාහක භාවය :.........................................

08. ස්ථිර ලිපිනය :.........................................

09. දුරකථන අංකය :.........................................

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? :.........................................

එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචියෙන්ද? යන බව :.........................................

11. අධ්‍යාපන සුදුසුකම්

11.01 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය
වර්ෂය :...............
විභාග අංකය :...............

| අනු අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

11.02 අ.පො.ස. (උසස් පෙළ) විභාගය
වර්ෂය :...............
විභාග අංකය:...............

| අනු අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

12. වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද ;
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................

13. අයදුම්කරුගේ සහතිකය

මා විසින් ඉහතින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. ඉහත තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා පත් කිරීම සඳහා නුසුදුස්සකු වන බවත්, තෝරාගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා වහාම සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් පැහැදිලිව දනිමි.

.................................
අයදුම්කරුගේ අත්සන.

දිනය ...........................

12-646/3